# 04 පළාත් පාලන ආයතන

**හැඳින්වීම**

අප එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමේ දී විවිධ සේවා ප්‍රයෝජනයට ගැනීමට සිදු වේ. එම සේවාවලින් බොහොමයක් ජීවිතය හා ඉතා ම සමීපව බැඳී පවතී. එමෙන් ම ඒවා අත්‍යවශ්‍ය වී තිබේ. සනීපාරක්ෂක සේවා, කසළ බැහැර කිරීම, රෝග මර්දනය කිරීම, විවේකය හා විනෝදය ගත කිරීම සඳහා ආරක්ෂිත ස්ථාන, පිරිසිදු හා ආරක්ෂිත මංමාවත් ඒවා අතර ප්‍රධාන තැනක් ගනී. මෙවැනි අත්‍යවශ්‍ය සේවා මහජනතාවට ලබා දීම සඳහා රජයේ ආයතනයක මැදිහත්වීම අත්‍යවශ්‍ය වී තිබේ.

එවැනි ප්‍රාදේශීය අවශ්‍යතා වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ආයතන විශේෂය පළාත් පාලන ආයතන ලෙස හැඳින්වේ. ඒවා මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා ලෙස වර්ග තුනක් යටතේ දැනට ක්‍රියාත්මක වේ. එම පළාත් පාලන ආයතන පිළිබඳව පුළුල්ව විමසා බැලීම මෙම පරිච්ඡේදයේ අරමුණයි.

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන්,

- පළාත් පාලන ආයතන හා ඒවායේ ව්‍යුහය
- පළාත් පාලන ආයතනවල අවශ්‍යතාව හා ඒවායින් තම ප්‍රදේශයට සපයන සේවා
- එම සේවා කාර්යක්‍ෂමව පවත්වාගෙන යාම සඳහා මහජනතාව විසින් ඉටු කළ යුතු යුතුකම්
- මහජන නියෝජිතයන් හා පළාත් පාලන ආයතනවලට සම්බන්ධ රජයේ නිලධාරීන් එම සේවා සැපයීම සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම් සහ
- ප්‍රාදේශීය සංවර්ධනය තුළින් ජාතික සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලින් ලැබෙන දායකත්වය විමර්ශනය කිරීම වැනි අංශ පිළිබඳ දැනුම්වත් වීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත.

## 4.1 පළාත් පාලන ආයතන

### 4.1.1 පළාත් පාලන ආයතන හඳුනා ගනිමු

එදින නිවාඩු දිනයකි. අචිනිගේ තාත්තා උදෑසන පත්තරය බලමින් සිටියේ ය. අචිනි තේ කෝප්පයක් ද රැගෙන තාත්තා වෙත පැමිණියා ය. තාත්තා බලමින් සිටි පුවත්පත වෙතට දෙනෙත් යොමු කළ අචිනි තාත්තා සමග කළ සංවාදයේ කොටසක් පහත දැක්වේ.

අචිනි - තාත්තේ අද පත්තරේ පළාත් පාලන ආයතන ගැන ගොඩක් විස්තර තියෙනවා නේද?.

තාත්තා - ආ... ඔව් දුව, පළාත් පාලන ආයතන ගැන තමයි මේ පිටු දෙකේ ම විස්තර තියෙන්නේ..

අචිනි - මොනවද තාත්තේ ඔය පළාත් පාලන ආයතන කියන්නේ ?

තාත්තා - ප්‍රාදේශීය පාලනය පහසු කරන්නයි ප්‍රාදේශීය අවශ්‍යතා ඉටු කරන්නයි පිහිටුවලා තියන ආයතන විශේෂය තමයි පළාත් පාලන ආයතන කියල කියන්නේ.

අචිනි - ආ එහෙනම් මේ ආයතන පිහිටුවල තියන්නේ අපේ ම පහසුව සඳහා නේද?

තාත්තා - ඔව් දුවේ, ඔයා මේ ලිපිය විවේකීව කියවල බලන්න. පළාත් පාලන ආයතන ගැන ගොඩක් තොරතුරු ඔයාට දැනගන්න පුළුවන් වේවි.

**පුවත්පතේ පළ වී තිබූ ලිපිය හොඳින් කියවා බැලූ අචිනි වැදගත් කරුණු කිහිපයක් සාරාංශ කර තිබුණේ මෙසේ ය.**

- පළාත් පාලන ආයතන මධ්‍යම රජයේ මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක වේ.
- ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන මහ නගර සභා, නගර සභා සහ ප්‍රදේශීය සභා වශයෙන් ක්‍රියාත්මක වේ.
- මධ්‍යම ආණ්ඩුව විසින් විවිධ ආඥාපනත් හා පනත් මගින් ප්‍රාදේශීය පාලන කටයුතු පළාත් පාලන ආයතන වෙත පවරා ඇත.
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කළ 13 වන සංශෝධනය මගින් පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පළාත් සභාවට පවරා ඇත.
- පළාත් පාලන ආයතනයක සංවිධාන ව්‍යුහය ඡන්දයෙන් තෝරාපත් කරගත් මහජන නියෝජිතයන්ගෙන් හා රජයේ නිලධාරීන්ගෙන් සමන්විත වේ.
- පළාත් පාලන ආයතන මධ්‍යම ආණ්ඩුවෙන් පනවන නියෝග මෙන් ම පළාත් සභාවෙන් පනවන නියෝග ද ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.
- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තුළ මධ්‍යම ආණ්ඩුවේ පාලන කටයුතු වඩා පහසුවෙන් පවත්වාගෙන යාමටත්, ශුභසාධන සේවා ජනතාවට වඩාත් සමීප ව ක්‍රියාත්මක කිරීමටත් පළාත් පාලන ආයතන දායකත්වය සපයයි.
- ප්‍රාදේශීය සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතන විශාල සේවාවක් ඉටුකරයි.

ප්‍රජා සේවා පහසුවෙන් හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ආයතන විශේෂය, පළාත් පාලන ආයතන ලෙස සරලව නිර්වචනය කළ හැකි ය.

## ක්‍රියාකාරකම 4.1



1. පළාත් පාලන ආයතන හැඳින්වීම සඳහා සරල නිර්වචනයක් ගොඩ නගන්න.
2. ඔබ පදිංචි ප්‍රදේශය/ඔබේ පාසල පිහිටි ප්‍රදේශය අයත් වන පළාත් පාලන ආයතනය නම් කරන්න.

### 4.1.2 පළාත් පාලන ආයතනවල අවශ්‍යතාව

මහජනතාවට අවශ්‍ය සේවා කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාම, පළාත් පාලන ආයතනවලින් ඉටු කරනු ලබන මූලික කාර්යභාරය වේ. පළාත් පාලන ආයතනවල අවශ්‍යතාව හඳුනා ගැනීම සඳහා පහත සටහන අධ්‍යයනය කරන්න.

**පළාත් පාලන ආයතනවල අවශ්‍යතාව**

- ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ප්‍රාදේශීය මට්ටම දක්වා පුළුල් කිරීම
- ප්‍රාදේශීය අවශ්‍යතාවලට ගැළපෙන පරිදි කටයුතු කිරීම
- ප්‍රජා සේවා විධිමත්ව පවත්වාගෙන යාමට පහසු වීම
- ප්‍රාදේශීය සංවර්ධනය තුළින් ජාතික සංවර්ධනය වේගවත් කිරීම
- ප්‍රාදේශීය ප්‍රතිපත්ති පදනම් කරගෙන ජාතික ප්‍රතිපත්ති සකස් කර ගැනීමට පහසු වීම
- මධ්‍යම ආණ්ඩුවේ කටයුතු විමධ්‍යගත කිරීම මගින් ප්‍රාදේශීය පාලන කටයුතු පහසු කර ගැනීම
- දේශපාලන නායකත්වය සඳහා තරුණ සහභාගිත්වය පුළුල් කිරීම
- අනාගත දේශපාලන නායකයන් ප්‍රාදේශීය මට්ටමින් බිහි කර ගත හැකිවීම
- හදිසි අවස්ථාවල දී ක්ෂණිකව ක්‍රියාත්මක වීම පහසු වීම

### 4.1.3 පළාත් පාලනයේ ඓතිහාසික විකාශනය

ශ්‍රී ලංකාවේ නූතන පළාත් පාලන ආයතනවල ආරම්භය බ්‍රිතාන්‍ය යුගයේ දී සිදු විය. එහෙත් ඈත අතීතයේ සිට ප්‍රාදේශීය පාලනය පිළිබඳ සංකල්පය ශ්‍රී ලංකාවේ පාලන ක්‍රමය තුළ ක්‍රියාත්මක වූ බවට ඉතිහාසය සාක්ෂි දරයි.

බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ වූ වැවිලි ආර්ථිකයත් සමග ඒවායේ සංවර්ධනය සඳහා යටිතල පහසුකම් (උදාහරණ : මාර්ග, පණිවුඩ හුවමාරු සේවා) සංවර්ධනය කිරීම ද අවශ්‍ය විය. ජන සංඛ්‍යා වර්ධනය, නාගරීකරණය, ජනතාවට අවශ්‍ය ශුභ සාධන සේවා සැපයීමේ අවශ්‍යතාව වැඩි වීම වැනි හේතු සාධක ද බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී විධිමත් පළාත් පාලන ආයතන පද්ධතියක් බිහි වීමට හේතු විය.

ඒ අනුව බ්‍රිතාන්‍ය පාලන යුගයේ පනවන ලද ආඥා පනත්, පළාත් පාලන ආයතන බිහි වීමට මෙන් ම ඒවායේ ක්‍රමික විකාශනයට ද බලපෑවේ ය.

බ්‍රිතාන්‍ය පාලන යුගයේ නිකුත් කරන ලද පළාත් පාලන ආයතන සම්බන්ධ ආඥා පනත් කිහිපයක් පහත දක්වා ඇත.

- ක්‍රි. ව. 1865 දී අංක 17 දරන මහනගර සභා ආඥාපනත මගින් කොළඹ, මහනුවර, ගාල්ල යන මහනගර සභා පිහිටුවීම
- ක්‍රි. ව. 1871 අංක 26 දරන ගම්කාර්ය සභා ආඥා පනත මගින් 1871 ගම්කාර්ය සභා පිහිටුවීම
- ක්‍රි. ව. 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත මගින් 1940 දී නගර සභා පිහිටුවීම
- 1946 අංක 03 දරන සුළු නගර සභා පනත මගින් 1946 දී සුළු නගර සභා පිහිටුවීම

**ශ්‍රී ලංකාවේ මුලින් ම ආරම්භ කළ මහනගර සභා**



කොළඹ මහනගර සභාව



ගාල්ල මහනගර සභාව




මහනුවර මහනගර සභාව

නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ පහත සඳහන් පළාත් පාලන ආයතන ක්‍රියාත්මක විය.

1. ගම්සභා
2. සුළුනගර සභා
3. නගර සභා
4. මහනගර සභා

1980 අංක 35 දරන දිස්ත්‍රික් සංවර්ධන සභා පනත මගින්,

- ගම්සභා සහ සුළුනගර සභා අහෝසි කර දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීමත්,
- දිස්ත්‍රික් සංවර්ධන සභාවල සහභාගිත්වය වැඩි කිරීමට ග්‍රාමෝදය මණ්ඩල හා ප්‍රාදේශීය මණ්ඩල පිහිටුවීමත් සිදු කරන ලදි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් දිස්ත්‍රික් සංවර්ධන සභා අහෝසි කර ප්‍රාදේශීය සභා පිහිටුවන ලදි.

ඒ අනුව 1987න් පසු ශ්‍රී ලංකාවේ,

- ප්‍රාදේශීය සභා
- නගර සභා
- මහ නගර සභා

යන පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වේ.

## ක්‍රියාකාරකම 4.2



''නිදහසින් පසු ශ්‍රී ලංකාවේ පළාත් පාලනයේ සිදු වූ වෙනස්කම්'' මැයෙන් බිත්ති පුවත්පතක පළ කිරීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

පළාත් පාලන අමාත්‍යාංශයේ මූලාශ්‍රය අනුව 2017.05.01 දිනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන

| පළාත | දිස්ත්‍රික්ක | මහනගර සභා | නගර සභා | ප්‍රාදේශීය සභා | එකතුව |
|---|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 05 | 05 | 03 | 13 |
| | ගම්පහ | 02 | 05 | 12 | 19 |
| | කළුතර | | 04 | 12 | 16 |
| මධ්‍යම | මහනුවර | 01 | 04 | 17 | 22 |
| | මාතලේ | 02 | - | 11 | 13 |
| | නුවරඑළිය | 01 | 02 | 05 | 08 |
| දකුණ | ගාල්ල | 01 | 02 | 17 | 20 |
| | මාතර | 01 | 01 | 15 | 17 |
| | හම්බන්තොට | 01 | 01 | 10 | 12 |
| උතුර | යාපනය | 01 | 03 | 13 | 17 |
| | මන්නාරම | - | 01 | 04 | 05 |
| | වව්නියා | - | 01 | 04 | 05 |
| | මුලතිව් | - | - | 04 | 04 |
| | කිලිනොච්චි | - | - | 03 | 03 |
| නැගෙනහිර | මඩකලපුව | 01 | 02 | 09 | 12 |
| | අම්පාර | 02 | 01 | 17 | 20 |
| | ත්‍රිකුණාමලය | - | 02 | 11 | 13 |
| වයඹ | කුරුණෑගල | 01 | 01 | 19 | 21 |
| | පුත්තලම | - | 02 | 10 | 12 |
| උතුරු මැද | අනුරාධපුර | 01 | - | 18 | 19 |
| | පොළොන්නරුව | - | - | 07 | 07 |
| ඌව | බදුල්ල | 02 | 01 | 15 | 18 |
| | මොනරාගල | - | - | 10 | 10 |
| සබරගමුව | රත්නපුර | 01 | 02 | 14 | 17 |
| | කෑගල්ල | - | 01 | 11 | 12 |
| එකතුව | | 23 | 41 | 271 | 335 |

## 4.1.4 පළාත් පාලන ආයතනවල ව්‍යුහය

පළාත් පාලන ආයතන මහජන නියෝජිතයන්ගෙන් සහ රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත ය. එම ආයතනවල කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කර ගැනීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගෙන් යුත් කාර්ය මණ්ඩලයක් පත් කර තිබේ. පළාත් පාලන ආයතනවල සංවිධාන ව්‍යුහයට අදාළ මූලික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.


- පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා මහජන නියෝජිතයෙකි.
- රාජ්‍ය නිලධාරීහු පරිපාලන කටයුතු මෙහෙයවීම සිදු කරති.
- පළාත් පාලන ආයතනයේ කටයුතු සම්බන්ධ තීන්දු තීරණ ගැනීම මහජන නියෝජිතයන් මගින් සිදු කෙරේ.

## පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්

| තනතුර ↓ / ආයතනය → | මහනගර සභාව | නගර සභාව/ප්‍රාදේශීය සභාව |
|---|---|---|
| ප්‍රධානියා | නගරාධිපති/ පුරපති | සභාපති |
| උපප්‍රධානියා | උපනගරාධිපති | උපසභාපති |
| පරිපාලන නිලධාරී | නාගරික කොමසාරිස් | ලේකම් |

එක් එක් පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයන්ගේ හා රාජ්‍ය නිලධාරීන්ගේ සැකැස්ම පහත පරිදි වේ.

ප්‍රාදේශීය සභාවක ව්‍යුහය



නගර සභාවක ව්‍යුහය

**සභාපති (මහජන නියෝජිත)**

↓

**උපසභාපති (මහජන නියෝජිත)**

- මහජන නියෝජිතවරුන් (නාගරික සභා මන්ත්‍රීවරුන්)
- රාජ්‍ය නිලධාරීන්
  - ↓ ලේකම්
  - ↓ අනෙකුත් නිලධාරීන්

උදා :- කාර්මික නිලධාරීන්
කළමනාකරණ සහකාර
රියැදුරු
සුළු සේවක
කම්කරු

මෙම මූලික සැලැස්ම ඒ ඒ නගර සභාව අනුව වෙනස් විය හැකි ය.

**මහනගර සභාවක සංවිධාන ව්‍යුහය**

**නගරාධිපති/පුරපති (මහජන නියෝජිත)**

↓

**නියෝජ්‍ය නගරාධිපති (මහජන නියෝජිත)**

- මහජන නියෝජිතවරුන් (නාගරික සභා මන්ත්‍රීවරුන්)
- රාජ්‍ය නිලධාරීන්
  - ↓ නාගරික කොමසාරිස්
  - ↓ අනෙකුත් නිලධාරීන්

උදා :- කාර්මික නිලධාරීන්
කළමනාකරණ සහකාර
රියැදුරු
සුළු සේවක
කම්කරුවන්

## ක්‍රියාකාරකම 4.3



1. ඔබ පාසල පිහිටි ප්‍රදේශය/ඔබ පදිංචි ප්‍රදේශය අයත් වන පළාත් පාලන ආයතනයේ සංවිධාන ව්‍යුහය ගුරුතුමියගේ සහයෝගය ඇතිව කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඇඳ දක්වන්න.
2. ඔබ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ සංවිධාන ව්‍යුහය පෙළපොතේ දක්වා ඇති ව්‍යුහය සමග සසඳන්න.

**පළාත් පාලන ආයතනයක ප්‍රධානියා සතු බලතල :**

1. සභාව කැඳවීම හා කල් තැබීම
2. සභාවේ මුලසුන දැරීම
3. මහජන උපයෝගිතා සේවා සැපයීමට මුල් වීම
4. පළාත් පාලන ආයතනය සතු කටයුතු සංවිධානය කිරීම සහ මෙහෙයවීම

- මහනගර සභාවක නාගරික කොමසාරිස් ධුරයට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු, අදාළ පළාත් සභාවේ ආණ්ඩුකාරතුමා විසින් පත් කරනු ලැබේ.
- නගර සභාවක/ප්‍රාදේශීය සභාවක ලේකම් තනතුර සඳහා රාජ්‍ය කළමනාකරණ සේවයේ අධිශ්‍රේණියේ නිලධාරියකු, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

පළාත් පාලන ආයතනවල ධුර කාලය අවසන් වූ විට මැතිවරණයක් පැවැත්වෙන තෙක් අදාළ නාගරික කොමසාරිස් හෝ ලේකම් හෝ පළාත් පාලන ආයතනය මෙහෙයවයි. නැතහොත් විශේෂ නිලධාරියෙකු වෙත පාලන බලතල පවරා දීම සිදු කෙරේ.

පළාත් පාලන ආයතන මගින් අදාළ සේවා ඉටු කිරීමේ දී එම ආයතනවලට බලතල රාශියක් හිමි වී තිබේ. ඒවාට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- වරිපනම් බදු ඇතුළු අනෙකුත් බදු පැනවීමට
- වීථි රේඛා සහතික නිකුත් කිරීමට
- නිවාස සැලසුම් අනුමත කිරීමට
- ස්ථිර ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් සඳහා අවසර දීමට
- අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට
- පරිසර සංරක්ෂණයට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීමට
- ප්‍රසිද්ධ මාර්ග, වීථි ඇළ මාර්ග, පාලම්, පොදු වෙළෙඳ පොළ, බෙහෙත් ශාලා, පුස්තකාල, උද්‍යාන ආදිය ඉදිකිරීමට හා නඩත්තු කිරීමට
- බෝවන රෝග වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට
- අනවසර මුඩුක්කු, පැල්පත් හා සෞඛ්‍යයට හානි කරන ස්ථාන ඉවත් කිරීමට
- ස්වාභාවික ජල උල්පත් හා ජලාශ පිළිබඳ අයිතිය පවත්වා ගැනීමට

ඉහත බලතල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, මහජන ශුභසිද්ධියට හා ප්‍රදේශයේ සංවර්ධනයට බෙහෙවින් උපකාරී වේ. පළාත් පාලන ආයතන ඉටු කරන විවිධ සේවා ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් උපයා ගැනීම විවිධ ක්‍රමවලට සිදු වේ. ඒවාට නිදසුන් කිහිපයක් පහත දක්වා ඇත.

**පළාත් පාලන ආයතන මූල්‍ය සම්පත් උපයා ගන්නා ආකාරය සඳහා නිදසුන්**

- වරිපනම්/ බදු මුදල්
- පළාත් පාලන අමාත්‍යවරයා විසින් පළාත් පාලන ආයතනවලට වෙන් කරනු ලබන ප්‍රදාන
- පළාත් පාලන ආයතනය සතු දේපළ බදු දීම්වලින්/කුලියට දීමෙන් ලැබෙන මුදල්
  (උදා : නගර ශාලා, කඩ, සාප්පු ආදිය)
- පොදු සේවා සැපයීමෙන් ලැබෙන ආදායම්
- නීති කඩකිරීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණය මගින් අය කරන දඩ මුදල්වලින් ලැබෙන ප්‍රතිපාදන
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හා අදාළ සභාවේ අනුමැතිය ඇතිව විදේශ රාජ්‍යවලින් ආධාරමය වශයෙන් ලැබෙන පරිත්‍යාග හා රාජ්‍ය නොවන සංවිධානවලින් ලැබෙන පරිත්‍යාග

## පළාත් පාලන ආයතනවලට නියෝජිතයන් පත් කිරීම


- අදාළ පළාත් පාලන බල ප්‍රදේශයේ ඡන්ද දායකයන්ගේ ඡන්දයෙන් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ නියෝජිතයන් තෝරා පත් කර ගැනීම මෙතෙක් සිදු විය. 2012 අංක 22 දරන පළාත් පාලන ඡන්ද විමසීම් සංශෝධන පනත මේ වන විට සම්මත කර ඇත. ඒ අනුව පළාත් පාලන ආයතන සඳහා මෙතෙක් පැවති ඡන්ද විමසීමේ ක්‍රමය වෙනස් කිරීමට නියමිත ය.
- ඒ අනුව ඡන්ද කොට්ඨාස මට්ටමින් කේවල (තනි) නියෝජන ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රමය යන ක්‍රම දෙක පදනම් කරගෙන පළාත් පාලන ආයතනවලට නියෝජිතයන් තෝරාපත් කර ගැනීමට යෝජිත ය.

## පළාත් පාලන ආයතනවල සීමා නිර්ණය කිරීම

පළාත් පාලන ආයතනවල සීමා නිර්ණය කිරීම ජාතික සීමා නිර්ණය කිරීමේ කමිටුවක් විසින් සිදු කෙරේ. ඒ අනුව පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන නිර්ණායක පහත දක්වා ඇත.

- ජන වාර්ගික ජනගහන අනුපාතය
- භූගෝලීය ප්‍රදේශය හා එහි භෞතික ලක්ෂණ
- ජනගහනය හා ජන ඝනත්වය
- ආර්ථික සංවර්ධන මට්ටම

පළාත් පාලන ආයතන බල ප්‍රදේශ සීමා නිර්ණය කිරීමට අනුව කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය දැක්වෙන සිතියම පහත දැක්වේ.







## ක්‍රියාකාරකම 4.4



1. පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයන් තෝරා පත් කර ගන්නා ආකාරය පිළිබඳව පන්ති භාර ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කර තොරතුරු සොයා කෙටි වාර්තාවක් ඉදිරිපත් කරන්න.

2. පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයන් තෝරා පත් කර ගැනීමට වඩාත් සුදුසු වන්නේ සමානුපාතික නියෝජන ක්‍රමය ද, නැතිනම් කොට්ඨාස ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රම දෙක පදනම් කරගත් මිශ්‍ර නියෝජන ක්‍රමය ද, යන මාතෘකා තෝරාගෙන පන්ති භාර ගුරුතුමා/ගුරුතුමියගේ මගපෙන්වීම යටතේ විවාදයක් පවත්වන්න.

## 4.2 පළාත් පාලන ආයතනවලින් ඉටු කෙරෙන සේවා

පුරවැසි අධ්‍යාපන විෂය යටතේ 9 ශ්‍රේණියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එදින ඉගෙනීමට නියමිතව තිබුණේ "පළාත් පාලන ආයතනවලින් ඉටු වන සේවා" පිළිබඳව ය. ඒ පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම සඳහා පන්ති භාර ගුරුතුමාගේ ආරාධනය පිළිගෙන, ප්‍රාදේශීය සභාවේ නිලධාරියකු වූ අනිල් මහතා නියමිත වේලාවට පන්තියට පැමිණ සිටියේ ය.

අනිල් මහතා පළාත් පාලන ආයතනවලින් ඉටු වන සේවා පිළිබඳව පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග කළ සංවාදයේ කොටසක් පහත දැක්වේ.

අනිල් මහතා ඃ ප්‍රදේශවාසීන්ටත්, විශේෂයෙන් පාසල් ළමුන්ටත් ප්‍රයෝජනවත් වන සේවා රැසක් පළාත් පාලන ආයතන මගින් සපයනවා.

පුස්තකාල, කියවීම් ශාලා, ළමා උද්‍යාන, ක්‍රීඩා පිටි, ව්‍යායාම සඳහා ඇවිදීමේ මංතීරු පවත්වා ගෙනයාම වැනි සේවා උදාහරණ ලෙස දක්වන්න පුළුවන්.

පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන ආදියත් පළාත් පාලන ආයතන මගින් පවත්වාගෙන යනවා.

ඒ වගේ ම පොදු වැදගත්කමකින් යුත් ආගමික හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් පළාත් පාලන ආයතන දායක වෙනවා.


පුස්තකාල සේවය


කියවීම් ශාලාව


ළමා උද්‍යානයක්


ව්‍යායාම සඳහා ඇවිදීමේ මං තීරු



**පෙරපාසලක්**

ෆාතිමා (ශිෂ්‍යාවක්) ඃ මාර්ග අලුත්වැඩියා කරන්නෙත් පළාත් පාලන ආයතන මගින් ද?

අනිල් මහතා ඃ ඔව්, පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශයට අයත් මාර්ග අලුත්වැඩියා කිරීම, පාලම් හා බෝක්කු ආදිය ඉදිකිරීම, අලුතෙන් මාර්ග තැනීම වැනි සේවාවනුත් ඉටු කරනවා. වීථි ආලෝක කිරීමත් පළාත් පාලන ආයතන මගින් සිදු කරනවා.



**ප්‍රාදේශීය මාර්ග නඩත්තු කටයුතු**

සඳරේකා (ශිෂ්‍යයෙක්) ඃ පළාත් පාලන ආයතනවලින් සැපයෙන වෙනත් සේවා මොනවාද ?

අනිල් මහතා ඃ සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා සැපයීම පළාත් පාලන ආයතනවලින් ඉටු කරන ප්‍රධාන සේවාවක්. මේ යටතේ ජලාපවහන හා මලාපවහන පද්ධති නිසි පරිදි පවත්වා ගෙනයාම, කාණු හා ඇළ මාර්ග නඩත්තු කිරීම පොදු වැසිකිළි පවත්වාගෙන යාම ආදී වටිනා සේවා රාශියක් ඉටු කරනු ලබනවා.



**මළාපවාහන ගලි සේවය**

අමිල (ශිෂ්‍යයෙක්) ඃ කසළ කළමනාකරණය පළාත් පාලන ආයතනවලින් සිදු කරන සේවාවක් නේද ?

අනිල් මහතා ඃ ඔව්, කසළ නිසි පරිදි කළමනාකරණය කිරීම පළාත් පාලන ආයතනවලින් ඉටු කරන ඉතා වැදගත් සේවාවක්. කසළ නිසි පරිදි බැහැර කිරීම, කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආදී කාර්ය පළාත් පාලන ආයතන මගින් ඉටු කරනවා.




**ප්‍රතිචක්‍රීකරණය සඳහා කසළ එක්රැස් කිරීම**

රවී ඃ සෞඛ්‍යයට අහිතකර ද්‍රව්‍ය විකිණීම වැළැක්වීමටත් පළාත් පාලන ආයතන කටයුතු කරනවා නේද ?

අනිල් මහතා ඃ ඔව් ඔව් බොහොම ස්තුතියි, ඒ ගැන මතක් කළාට. සෞඛ්‍යයට අහිතකර දේවල් විකුණන එක ගැන විතරක් නෙවෙයි, එවැනි දේවල් ගැන ප්‍රචාරය කිරීම වැළැක්වීමටත් කටයුතු කරනවා. පළාත් පාලන ආයතන මගින් සපයන තවත් සේවා ගොඩක් තියෙනවා.

පොදු සුසාන භූමි, ආදාහනාගාර නඩත්තු කිරීම, පොදු නාන ළිං පවත්වාගෙන යාම, ප්‍රාදේශීය අවශ්‍යතා අනුව ජල පහසුකම් සැපයීම ආදිය සිදු කරනවා. ගිනි නිවීමේ සේවා ආදී සේවා සැපයීමත් පළාත් පාලන ආයතන මගින් ඉටු කරන සේවාවක්.



**පොදු ළිඳ**



**ගිනි නිවීමේ සේවය**

මලිති (ශිෂ්‍යාවක්) ඃ අපේ ප්‍රාදේශීය සභාවෙන් අපේ ගමේ සායනයක් සංවිධානය කරල තිබුණා.

අනිල් මහතා ඃ ඔව් ඔව් අක්ෂි සායන, ළදරු සායන, මාතෘ සායන, ඩෙංගු වැනි වසංගත රෝග මර්දන වැඩසටහන්, බෝ නොවන රෝග මර්දන වැඩසටහන් ආදියත් පළාත් පාලන ආයතන මගින් පවත්වනවා. ආයුර්වේද බෙහෙත් ශාලා මගින් වෛද්‍ය සේවා සැපයීමත් සිදු කරනවා. ඒ විතරක් නොවෙයි. වැඩිහිටියන් සඳහා සමාජ ආරක්ෂණ ව්‍යාපෘති ආදියත් ක්‍රියාත්මක කරනවා.



**ඩෙංගු පාලන වැඩසටහනක්**



මාතෘ සායන



ග්‍රාමීය වෛද්‍ය සායනයක්

අචිනි (ශිෂ්‍යාවක්) : ප්‍රදේශයේ සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතන මගින් සිදු කරනු ලබන තවත් වැඩසටහන් තියෙනවා ද ?

අනිල් මහතා : ජල මාර්ග සංවර්ධනය, සුළු වාරි මාර්ග සංවර්ධනය ආදිය මගින් ආර්ථික දියුණුවටත් දායක වෙනවා. ඒ විතරක් නෙවෙයි, පරිසර සංරක්ෂණ වැඩසටහන් පවත්වාගෙන යාමත් පළාත් පාලන ආයතන මගින් සිදු කරනු ලබනවා.

පළාත් පාලන ආයතනවලින් සිදු වන සේවා ඉතා හොඳින් පැහැදිලි කරදීම පිළිබඳව පන්ති නායක අසිත, අනිල් මහතාට ස්තුති කළේ මෙසේ යෑ

අප මෙතෙක් දැනගෙන හිටියෙ නැහැ, මෙතරම් විශාල සේවයක් පළාත් පාලන ආයතනවලින් සිදු වෙනවා කියල. හරි ම අපූරුවට ඔබතුමා ඒ ගැන අපට කියල දුන්න. පරිසරය පිරිසිදුව තියා ගන්න, එදිනෙදා කටයුතු පහසු කරගන්න අපට උපතේ සිට මරණය දක්වා වූ විවිධ අවස්ථාවල දී විශාල සේවයක් පළාත් පාලන ආයතනවලින් ඉටු වෙනවා. පළාත් පාලන ආයතනවල සේවය කරන හැමෝම අප වෙනුවෙන්, රට වෙනුවෙන් විශාල සේවයක් කරන බව අපට දැන් පැහැදිලියි. ඒ ගැන අපිට හරි ම සතුටුයි. අපිව දැනුම්වත් කරන්න පැමිණීම වෙනුවෙන් හා අප සමග සුහදව සංවාදයක් පැවැත්වීම ගැන අපේ ආදරයත්, ගෞරවයත් ඔබතුමාට පුද කරන්න කැමතියි.

## ක්‍රියාකාරකම 4.5



1. පළාත් පාලන ආයතන මගින් සපයනු ලබන පහත දැක්වෙන සේවා ප්‍රදේශයේ මානව සම්පත සංවර්ධනය සඳහා දායක වන අයුරු විෂයභාර ගුරුතුමා/තුමිය සමග සාකච්ඡා කරන්න
   - පුස්තකාලය හා කියවීම් ශාලා පවත්වාගෙන යාම
   - ක්‍රීඩා පිට්ටනි පවත්වාගෙන යාම
   - වෛද්‍ය සායන පැවැත්වීම
2. ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා ඔබ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් කිහිපයක් යෝජනා කරන්න

## 4.3 පළාත් පාලන ආයතනවල සේවා සම්බන්ධයෙන් මහජනතාව විසින් ඉටු කළ යුතු යුතුකම්

පළාත් පාලන ආයතනවලින් සපයන සේවා උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින් තම ජීවන තත්ත්වය උසස් කර ගැනීමට මහජනතාවට අයිතියක් තිබේ. එමෙන් ම ලබා ගන්නා එම සේවා වෙනුවෙන් තම යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීම ද **සේවාලාභීන්ගේ යුතුකමකි.**

**මහජනතාව (සේවාලාභීන්) විසින් ඉටු කළ යුතු යුතුකම්වලට උදාහරණ කිහිපයක් පහත දැක්වේ.**

- කලට වේලාවට නියමිත බදු ගෙවීම
- සපයන සේවා සඳහා නිසි පරිදි බිල්පත් ගෙවීම
- කසළ හා අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම හා කසළ කළමනාකරණය සඳහා පළාත් පාලන ආයතනවලින් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීම
- පරිසරය පිරිසිදුව තබා ගැනීම හා පරිසර සංරක්ෂණ කටයුතු සඳහා දායක වීම
- පොදු දේපළ ආරක්ෂා කිරීම හා අරපිරිමැස්මෙන් යුතුව ප්‍රයෝජනයට ගැනීම
- ඉදිකිරීම් වැනි කටයුතුවල දී නීත්‍යානුකූල අනුමැතිය ලබා ගැනීම
- පළාත් පාලන ආයතනයට සම්බන්ධ මහජන නියෝජිතයන් හා නිලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම
- ප්‍රාදේශීය අවශ්‍යතා පිළිබඳව මහජන නියෝජිතයන් සහ නිලධාරීන් දැනුම්වත් කිරීම
- සේවා බිඳවැටීම්වල දී හෝ හදිසි අවස්ථාවල දී නඩත්තු කටයුතු පිළිබඳව දැනුම්වත් කිරීම

## 4.4 පළාත් පාලන ආයතනවල සේවා ඉටු කිරීම සම්බන්ධයෙන් මහජන නියෝජිතයන්ගෙන්/රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉටු විය යුතු වගකීම් හා යුතුකම්

පළාත් පාලන ආයතන මගින් සපයන සේවා ජන ජීවිතය යහපත් කර ගැනීමට හේතු වන ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීමට මෙම පරිච්ඡේදයෙන් ඔබට අවස්ථාව ලැබුණි. පළාත් පාලන ආයතනවලට සම්බන්ධ මහජන නියෝජිතයන් මෙන් ම, රාජ්‍ය නිලධාරීන් ද තම වගකීම් හා යුතුකම් මැනවින් ඉටු කිරීම, මහජනතාව වෙනුවෙන් ප්‍රශස්ත මට්ටමේ සේවාවක් සැපයීමට අත්‍යවශ්‍ය වේ.

**මහජන නියෝජිතයන්ගෙන්/ නිලධාරීන්ගෙන් ඉටු විය යුතු වගකීම් හා යුතුකම්**

**වගකීම්**

- ප්‍රදේශයේ සම්පත් හඳුනා ගැනීම
- මහජන ගැටලු හා අවශ්‍යතා හඳුනා ගැනීම
- සංවර්ධන උපාය මාර්ග හඳුනා ගැනීම
- සැලසුම් සකස් කිරීමට අවශ්‍ය සහාය ලබා දීම
- අවශ්‍යතා සැලකිල්ලට ගෙන තීරණ ගැනීම
- තීරණ ක්‍රියාත්මක කිරීමේ දී සොයා බැලීම
- නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීම
- නායකත්වය සැපයීම
- වංචා, දූෂණ හා අල්ලස් ආදියට එරෙහිව කටයුතු කිරීම
- රාජ්‍ය සේවා හා පොදු දේපළ අයථා ලෙස පරිහරණය කිරීම වැළැක්වීමට කටයුතු කිරීම
- සංවර්ධන කටයුතු නිසි පරිදි අධීක්ෂණය කිරීම
- තමන්ට අයත් රාජකාරි නිසි ලෙස ඉටු කිරීම

**යුතුකම්**

- මහජන දුක්ගැනවිලිවලට සවන් දීම
- මහජනතාව සමග සමීප සබඳතා පවත්වාගෙන යාම
- රැස්වීම්වලට සහභාගි වීම
- වංචා, දූෂණ හා අල්ලස් වළක්වාලීම
- මහජන ශුභසිද්ධිය වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කිරීම
- අවංක වීම
- ජනතාවට ප්‍රිය මනාප ස්ථානයක් බවට ආයතනය පත් කිරීම
- මහජන අවශ්‍යතා කාර්යක්ෂමව ඉටු කිරීම
- පොදු දේපළ හා රාජ්‍ය සේවා අයථා ලෙස පරිහරණය කිරීමෙන් වැළකීම
- ඉහළ ප්‍රමිතියකින් යුතුව සේවය සැපයීම

## ක්‍රියාකාරකම 4.6



1. පළාත් පාලන ආයතනවලට සම්බන්ධ මහජන නියෝජිතයකු/රාජ්‍ය නිලධාරියකු විසින් ඉටු කළ යුතු යුතුකම් කිහිපයක් පහත වගුවේ I තීරුවේ සඳහන් කර ඇත. තම දෛනික රාජකාරි/ සේවා ඉටු කිරීමේ දී එම යුතුකම් ඉටු කිරීම සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත් II තීරුවේ සටහන් කරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| **මහජන නියෝජිතයන් හා රාජ්‍ය නිලධාරීන් විසින් ඉටු කළ යුතු යුතුකම්** | **දෛනිකව තම සේවා/ රාජකාරි ඉටු කිරීමේ දී යුතුකම් ඉටු කිරීම සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත්** |
| මහජනතාව සමග සමීප සබඳතා පැවැත්වීම | |
| මහජන අවශ්‍යතා කාර්යක්ෂමව ඉටු කිරීම | |
| රාජ්‍ය දේපළ අයථා ලෙස පරිහරණය කිරීමෙන් වැළකීම | |
| මහජන ශුභසිද්ධිය වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කිරීම | |

## 4.5 ජාතික සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවල දායකත්වය

ප්‍රාදේශීය වශයෙන් සිදු වන සංවර්ධන ක්‍රියාවලියේ අග්‍රඵලය වන්නේ රටක සමාජීය, ආර්ථික හා සංස්කෘතික ආදී සෑම අංශයක ම ඇති වන සමස්ත සංවර්ධනයයි. සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පාරිසරික සමතුලිතතාව ආරක්ෂා කරගැනීම ද කාලීන අවශ්‍යතාවක් බවට පත්ව තිබේ. ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ඍජුව ම දායක වන ආයතන විශේෂය වන්නේ පළාත් පාලන ආයතනයි. ප්‍රාදේශීය සංවර්ධනය තුළින් ජාතික සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වීමේ දී පළාත් පාලන ආයතන විසින් අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් නිදසුන් ලෙස පහත දක්වා ඇත.

i. ප්‍රාදේශීය අවශ්‍යතා හා සම්පත් හඳුනා ගැනීම
ii. ප්‍රාදේශීය අවශ්‍යතා ඉටු කිරීම සඳහා සම්පත් හඳුනාගෙන ඊට ගැළපෙන ලෙස සැලසුම් සකස් කිරීම
iii. සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම
iv. ප්‍රාදේශීය නායකයන් බිහි කිරීම

ඉහත කරුණු පිළිබඳව කෙටි විස්තරයක් පහත දැක්වේ.

### i. ප්‍රාදේශීය අවශ්‍යතා හඳුනා ගැනීම

එක් එක් ප්‍රදේශවල ජීවත් වන ජනතාවට විශේෂ වූ අවශ්‍යතා ප්‍රාදේශීය අවශ්‍යතා ලෙස හැඳින්විය හැකි ය. එවැනි අවශ්‍යතා විවිධ වේ. එම විවිධත්වයට බලපාන කරුණු රාශියකි.
එක් එක් ප්‍රදේශවල පවත්නා,

- සම්පත්වල ව්‍යාප්තිය
- සංස්කෘතික විවිධත්වය
- භූගෝලීය පසුබිම යන සාධක ප්‍රාදේශීය අවශ්‍යතා විවිධ වීමට බලපා තිබේ.

ඒ අනුව එක් එක් ප්‍රදේශවලට විශේෂ වූ විවිධ අවශ්‍යතා හඳුනා ගැනීම පළාත් පාලන ආයතනවලට පැවරෙන ප්‍රබල වගකීමකි. ඒ අනුව ප්‍රාදේශීය අවශ්‍යතාවලට උදාහරණ කිහිපයක් පහත දක්වා ඇත.

- වියළි කලාපීය ප්‍රදේශයක ජීවත් වන ජනතාවට පානීය ජලය සැපයීම
- නාගරික ප්‍රදේශවල කසළ බැහැර කිරීම හා කසළ නිසි පරිදි කළමනාකරණය කිරීම
- ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට විවේකය අර්ථවත්ව ගත කිරීම සඳහා පහසුකම් සැපයීම
  (පුස්තකාල සේවා, ක්‍රීඩා පිට්ටනි, ඇවිදීම සඳහා මංතීරු, ළමා උද්‍යාන ආදිය)
- අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස පහසුකම් සැපයීම
- වීථි ආලෝක කිරීම
- ළමා සංවර්ධනය සඳහා පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම
- ඩෙංගු වැනි වසංගත රෝග බෝවීමේ අවදානම පවතින ප්‍රදේශවල එය මර්දනය කිරීමට පියවර ගැනීම

## ii. ප්‍රාදේශීය අවශ්‍යතා හා සම්පත් හඳුනා ගෙන ඊට ගැළපෙන පරිදි සැලසුම් සකස් කිරීම

### ජල සම්පාදනය

ජල හිඟයක් පවතින ප්‍රදේශවලට ජල සම්පාදන යෝජනා ක්‍රමයක් සැලසුම් කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර

උදාහරණ ඃ

- පානීය ජල හිඟයක් පවතින ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා සුදුසු ජල මූලාශ්‍රය හඳුනා ගැනීම
- ජාතික මට්ටමේ ජල සම්පාදන යෝජනා ක්‍රම මගින් ජලය සපයා ගැනීමට ඇති හැකියා පිළිබඳව සොයා බැලීම
- ජල යෝජනා ක්‍රමය සඳහා මුදල් ලබා ගැනීමේ ක්‍රමවේද සැලසුම් කිරීම
- තාක්ෂණික සහාය ලබා ගැනීම



නළ ළිං ස්ථාපිත කිරීම




බවුසර් මගින් පානීය ජලය බෙදා හැරීම

### කසළ බැහැර කිරීම

- නිවාස ආශ්‍රිතව කොම්පෝස්ට් පොහොර නිපදවීම සඳහා බඳුන් සැපයීම හා අවශ්‍ය උපදෙස් ලබා දීම
- කසළ වර්ග කර බැහැර කිරීමට සැලැස්වීම
- කසළ බඳුන් සැපයීම
- කසළ එක්රැස් කිරීම
- ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් සැලසුම් කිරීම
- කාබනික පොහොර නිෂ්පාදනය සඳහා සැලසුම් සකස් කිරීම
- කසළ නිසි පරිදි බැහැර කිරීමේ නෛතික හා සදාචාරාත්මක යුතුකම් පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම ආදී ක්‍රියාකාරකම් ඇතුළත් කර නිසි පරිදි මෙම සැලසුම් සකස් කළ යුතු ය.




කසළ කළමනාකරණය

### ඩෙංගු මර්දනය වැනි වසංගත රෝග පාලනයට කටයුතු කිරීම

- ප්‍රදේශයේ ඩෙංගු රෝගය බෝ වීමේ අවදානම පවතින ස්ථාන හඳුනා ගැනීම
- එම ස්ථාන පවිත්‍ර කිරීම/වාහක මදුරුවන් වැනි සතුන් විනාශ කිරීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග යෝජනා කිරීම

- ඒ සඳහා රාජ්‍ය ආයතනවල/ස්වේච්ඡා සංවිධානවල/ප්‍රදේශයේ ජනතාවගේ/ සහාය ලබා ගැනීම ආදි ක්‍රියාකාරකම් ඇතුළත් සැලසුම් සකස් කිරීම

### iii. සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම

අපේක්ෂිත අරමුණු ඉටු වන ආකාරයට මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීමට වග බලා ගැනීම පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන්ගේ මෙන් ම රාජ්‍ය නිලධාරීන්ගේ ද වගකීම හා යුතුකම වේ. එමෙන් ම එම සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න අධීක්‍ෂණයට ලක් කිරීම මගින් මහජනතාවට වඩාත් හොඳ සේවාවක් සැපයීමට පළාත් පාලන ආයතනවලට හැකියාව ලැබෙනු ඇත.

උදාහරණ ඃ

- ප්‍රාදේශීය මාර්ග ඉදිකිරීම/ප්‍රතිසංස්කරණය ආදි කටයුතුවල දී ඒවා නිසි ප්‍රමිතියට අනුව සිදු වන්නේ දැයි අධීක්ෂණය කිරීම
- කසළ කළමනාකරණයේ දී පළාත් පාලන ආයතන සේවකයන් මෙන් ම ප්‍රදේශවාසීන් ද තම වගකීම් නිසි පරිදි ඉටු කරන්නේ ද යන්න පිළිබඳ අධීක්‍ෂණය කිරීම හා අවශ්‍ය අවස්ථාවල දී ඔවුන් ඒ පිළිබඳව දැනුම්වත් කිරීම

### iv. ප්‍රාදේශීය මට්ටමින් නායකයන් බිහි කිරීම

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ, අවංක, කාර්යශූර හා උදාර දේශපාලන නායකත්වයයි. පළාත් පාලන ආයතන ද ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තුළ ප්‍රාදේශීය පාලනය සම්බන්ධයෙන් බලතල පැවරෙන ජනතාවට සමීපතම පාලන ආයතන වේ. මේ නිසා ප්‍රදේශයේ ජීවත් වන ජනතාව අතුරින් ප්‍රජාතාන්ත්‍රීය ගුණාංගවලින් යුක්ත ආදර්ශවත් චරිත ප්‍රාදේශීය දේශපාලන නායකයන්, පළාත් පාලන ආයතන නියෝජිතයන් ලෙස තෝරා පත් කර ගැනීමට ජනතාවට අයිතියක් තිබේ. එමෙන් ම එය ජනතාව විසින් ඉටු කළ යුතු ඉතා වැදගත් යුතුකමක් ද වන්නේ ය.

එසේ පත් කර ගන්නා නියෝජිතයන් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සේවයට කැප වී කටයුතු කිරීම මගින් යහපත් දේශපාලන අත්දැකීම්, පළපුරුද්ද හා පුහුණුව ලබා ගැනීමට ඔවුන්ට අවස්ථාව උදා වේ. එවන් කැපී පෙනෙන උදාර නායකයන් ජාතික දේශපාලනයට හඳුන්වා දීම ඉතා වැදගත් ජාතික මෙහෙවරක් වේ.

මෙම ක්‍රියා මාර්ග අනුගමනය කිරීමෙන් සෞභාග්‍යවත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා පළාත් පාලන ආයතනවලට ලබා දිය හැකි දායකත්වය ඉමහත් ය.

## ක්‍රියාකාරකම 4.7



1. පළාත් පාලන ආයතනයට නියෝජිතයකු තෝරා පත් කිරීමේ දී ඡන්ද අපේක්ෂකයකු තුළ පැවතිය යුතු යැයි ඔබ අදහස් කරන යහපත් ගුණාංග කිහිපයක් ලැයිස්තුගත කරන්න.
2. ගෙවත්තේ/පාසලේ මදුරුවන් බෝ වීම වැළැක්වීම සඳහා දෛනිකව ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් ලැයිස්තුවක් සකස් කරන්න.
3. නිවස ආශ්‍රිත ව එදිනෙදා එකතු වන කසළ කළමනාකරණය කිරීම සඳහා ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න.

## සාරාංශය



- පළාත් පාලන ආයතන යනු මහජන උපයෝගිතා සේවා ප්‍රාදේශීය මට්ටමින් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම රජය විසින් පිහිටුවන ලද ආයතන විශේෂයකි.
- පළාත් පාලන ආයතන මහජන නියෝජිතයන්ගෙන් හා රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත වේ.
- ප්‍රාදේශීය පාලනය පිළිබඳව සංකල්පය රාජාණ්ඩු සමයේ පටන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වී තිබේ.
- නූතන පළාත් පාලන ආයතනවල විකාශනය බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ වී ඇත.
- නිදහස ලැබීමෙන් පසු පනවන ලද පනත් මගින් පළාත් පාලන ආයතන පද්ධතියේ විවිධ වෙනස්කම් සිදු කරන ලදි
- ශ්‍රී ලංකාවේ දැනට මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වශයෙන් පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වේ.
- පළාත් පාලන ආයතන මගින් ජන ජීවිතය පහසු හා යහපත් කිරීම සඳහා සේවා රාශියක් සපයනු ලබයි.
- පළාත් පාලන ආයතනවලට සම්බන්ධ මහජන නියෝජිතයන් හා නිලධාරීන් තම යුතුකම් හා වගකීම් මැනවින් ඉටු කිරීම, එම සේවා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට බෙහෙවින් ඉවහල් වේ.
- පළාත් පාලන ආයතනවලින් ඉටු වන සේවා සම්බන්ධයෙන් මහජනතාව තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම එම සේවා කාර්යක්ෂමව ඉටු කිරීමට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.
- ප්‍රාදේශීය සංවර්ධනය තුළින් ජාතික සංවර්ධන උපාය මාර්ග සාර්ථක කර ගැනීමට හා පළාත් පාලන ආයතනවලට ඉහළ දායකත්වයක් ලබා දීමට හැකියාව තිබේ.